**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.388,525 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.396,192 ක් ලෙස දැක්වීමෙන් උසාවි දඩ ආදායම හා ණයගැතියන් රු.7,667 බැගින් වැඩියෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් ආයෝජන වටිනාකම රු.1,396,104 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,352,159 ක් ලෙස දක්වා තිබීමෙන් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුම් ශේෂය රු.43,945 කින් අඩුවෙන් දැක්විණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය වෙනුවෙන් ගාල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.10,385,422 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.6,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් ණයගැතියන් හා සමුච්චිත අරමුදල් ගිණුම් ශේෂය රු.4,385,422 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඈ) බලපිටිය හා ඇල්පිටිය රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලවලින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.1,085,540 ක් වූ මුද්දර ගාස්තු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් වර්ෂයේ ආදායම් හා ණයගැතියන් රු.1,085,540 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඉ) වැටුප් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.21,024,623 ක මුදල සියළුම වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මිළදී ගෙන තිබූ රු.1,697,914 ක ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ රු.33,992 කට මිළදී ගෙන තිබුණු අඩි 20 ක් වූ ඉනිමග සමාලෝචිත වර්ෂයේ දී අඩි 32 ක ඉනිමගකට හුවමාරු කර එකී ඉනිමගෙහි වටිනාකම වූ රු.70,938 ක් ප්‍රාග්ධනිත කර තිබූ අතර හුවමාරු කරන ලද අඩි 20 ඉනිමගෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබීමෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.33,992 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඌ) ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර තිබුණු රු.1,500,000 ක ස්ථාවර තැන්පත් සහතික 06 හි සමාලෝචිත වර්ෂයට අදාළ පොළී ආදායම රු.108,002 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.85,142 ක් ලෙස දක්වා තිබීමෙන් ණයගැතියන් සහ පොළී ආදායම රු.22,860 බැගින් අඩුවෙන් දැක්විණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට “ගමින් ගමට - දොරින් දොරට” වැඩසටහනෙහි රු.1,847,104 ක වටිනාකම වූ කර්මාන්ත 04 ක් සඳහා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර හා ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයගැතියන් හා ප්‍රාග්ධන ආදායම් සහ ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,632,131 ක් වූ කර්මාන්ත 34 ක් සඳහා ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.7,632,131 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ රු.914,916 ක වටිනාකම වූ මග නැගුම කර්මාන්ත 03 ක් සඳහා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයගැතියන් හා ප්‍රාග්ධන ආදායම් රු.914,916 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඕ) සභා බලප්‍රදේශය තුළ ඉඩම් වෙන්දේසිවලින් සභාවට පැවරී තිබූ ඉඩම් වල වටිනාකම වන රු.16,129,325 ක ඉඩම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.3,451,369 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.81,816 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.101,615,377 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ශේෂ තහවුරු සහතික, ණය ලේඛනය, අත්තිකාරම් ලේඛනය සහ ස්ථිර තැන්පත් සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා 02 ක් සඳහා විදේශ ගතවීමට විධිමත් අනුමැතියකින් ද තොරව සභාපතිවරයා, උප සභාපතිවරයා හා සභිකයින් 06 දෙනෙකු වෙත රු.1,500,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,437,038 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,309,947 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.25,458,796 ක් වූ වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 බදු කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.2,203,287 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 කඩ කාමර බදු

ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 40 ක බදු අයකිරීම් පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1999 සැප්තැම්බර් 30 දින දී කඩ කාමර ප්‍රථමයෙන් බදු දී තිබූ අතර වසර 13 කට පසු මෙම කඩ කාමර 2012 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි 2013 ජනවාරි මාසයේ දී නැවත තක්සේරු කර තිබුණි.

(ii) 1999 ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 11 දින වනතෙක් ගිවිසුම් නැවත අළුත් කර නොතිබුණි.

(iiii) 1999 වර්ෂයේ දී අත්සන් කරන ලද ගිවිසුමේ 2 වන කොන්දේසිය අනුව නව තක්සේරු මත බදු නොගෙවීම නිසා 2012 ජනවාරි සිට 2015 සැප්තැම්බර් දක්වා කඩ කාමරවලින් රු.6,878,750 ක බදු කුලී ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

-----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.151,748 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.500,502 ක උසාවි දඩ හා රු.28,153,346 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 අවිධිමත් ගනුදෙනු**

--------------------

**ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන**

----------------------------------------------------------

2014 වර්ෂයට අදාල අයවැය යෝජනා මගින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් විසින් 2014 මැයි 05 වන දින නිකුත් කළ අංක : 1/2014 දරන චක්‍රලේඛ අනුව ප්‍රාදේශීය සභා නඩත්තු ඒකක මගින් ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා සෑම ප්‍රාදේශීය සභාවකටම මසකට රු.1,000,000 බැගින් ලබාදීම යටතේ ප්‍රාදේශීය සභාවට 2014 වර්ෂය තුළ රු.4,000,000 ක් ලැබී තිබුණි.

මෙම චක්‍රලේඛයේ 3 ඡේදය අනුව කිසිදු අවස්ථාවකදී නව ව්‍යාපෘති හඳුනා නොගත යුතු අතර දැනට පවතින යටිතල පහසුකම් අලුත්වැඩියා හා නඩත්තු කිරීමේ කාර්යයන් සඳහා පමණක් මුදල් යොදාගත යුතු බව දන්වා තිබුණ ද, ඊට පටහැනිව සභිකයින් 11 ක් සඳහා ලැප්ටොප් පරිගණක 11 ක් රු.1,120,900 කට මිළදී ගැනීම සඳහා 2015 පෙබරවාරි 26 දින ගෙවීම් කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අගරු චෙක්පත්**

**----------------**

2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුන රු.20,339 ක් වූ අගරු චෙක්පත් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවක ඇප තැන්පත්**

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ (ix අධිකාරය) 180 හා 182 රීති ප්‍රකාරව මුදල් අයකැමි විසින් විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 11 දින වනවිටත් ඇප තබා නොතිබුණි.

**(ඇ) සේවක ණය**

--------------

සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය / විශ්‍රාම ගිය සේවකයන් 28 දෙනෙකුගෙන් අයකර ගත යුතුව තිබූ රු.104,566 ක ණය ශේෂයක් 2012 වර්ෂයට පෙර සිට අයවීම් හිඟහිටව තිබුණි.

**(ඈ) අබලි වාහන අපහරණය**

---------------------------

සභාව සතු අබලි වාහන 03 අපහරණය කිරීමට 2013 ඔක්තෝබර් 01 දින කටයුතු ආරම්භ කර තිබුණි. විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 11 දින වනවිට අවුරුදු 02 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, අපහරණ කටයුතු අවසන් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**(ඉ) යන්ත්‍රෝපකරණ ලබාදීමේ වැඩසටහන**

--------------------------------------------

පළාත් පාලන ආයතන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙල යටතේ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වන වාහන පිළිබඳ 2014 මාර්තු 10 දින පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද ලිපියට අනුව සභාවේ ලේකම් විසින් වාහන 06 ක් සභාවට අවශ්‍ය බව 2014 මාර්තු 14 දින දන්වා යවා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාව විසින් ඉල්ලුම් කළ බැකෝ යන්ත්‍රය වෙනුවට මෝටර් ග්‍රේඩරයක් ලබාදීම මගින් සභාව සතු මාර්ගවල ධාවනය කිරීමට නොහැකි, අනවශ්‍ය වාහනයක් ලබා දී තිබුණි.

(ii) සභාව විසින් ඉල්ලා නොතිබූ කෘ කැබ් රථයක් ලබා දී තිබුණි.

(iii) සභාවට ලද මෝටර් ග්‍රේඩරය, කෘ කැබ් රථය සහ ඩම්ප් ට්‍රක් රථය සඳහා විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 11 දින දක්වා ලියාපදිංචි සහතික ලැබී නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

**හපුගල සිරිධර්මරතන මාවත**

-------------------------------

මීටර් 60 ක් කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම සඳහා 2013 ජූලි 26 රු.499,464 කට ඇස්තමේන්තු සකසා 2013 දෙසැම්බර් 30 මාස 03 කින් වැඩ නිම කිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණි. කර්මාන්තයේ වැඩ අවසන් කර මිණුම් පත්‍රය හා රු.497,865 ක බිල්පතක් 2014 මාර්තු 06 දින ඉදිරිපත් කර තිබූ අතර රු.448,078 ක් ගෙවීම් කර තිබුණි. විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 11 දින දක්වා රැඳවුම් මුදල් රු.49,787 ක් ගෙවා නොතිබුණි.

කර්මාන්තය පිළිබඳව 2015 සැප්තැම්බර් 11 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී කුට්ටි ගල් ඉවත් වී වලක් සෑදී තිබූ අතර පාර ගිලා බැස තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය